# ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**2024 ලෝක ජනාවාස දින පාසල් චිත්‍ර / රචනා තරගය**

ඔක්තෝබර් මස 07 වෙනි දිනට යෙදී ඇති 2024 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන චිත්‍ර හා රචනා තරග සඳහා දිවයිනේ සියලුම පාසල් ශිෂ්‍ය / ශිෂ්‍යයාවන්ට මෙයින් ආරාධනා කරනු ලැබේ.

**ඔබේ නිර්මාණ සඳහා පදනම් කර ගත හැකි විෂය ක්ෂේත්‍ර**

- නාගරික අනාගතයක් නිර්මාණය සඳහා තරුණ ශක්තිය
- තුරුණු සවියෙන් හරිත නගරයක්
- නාගරික ජනාවාසයන්හි අනාගතය කෙරෙහි තාරුණ්‍යයේ හැසිරීමේ බලපෑම
- අනාගත නගරයක ජනාවාස

ඉහත සඳහන් එක් අදහසක් හෝ අදහස් සියල්ල හෝ ගොනු කොට අයදුම්කරුවන්ට සිය චිත්‍ර හා රචනා නිර්මාණය කළ හැකි වේ.

**තරග සහභාගිත්වය :**

රජයේ පාසලක හෝ පෞද්ගලික පාසලක හෝ ශිෂ්‍ය / ශිෂ්‍යයාවන්ට මේ තරග සඳහා සහභාගි විය හැකිය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන්ගේ දරුවන්ට මෙම තරග සඳහා සහභාගි විය නොහැකි ය.

## පාසල් චිත්‍ර තරගය
### තරග කාණ්ඩ

| | |
|---|---|
| පළමු කාණ්ඩය | - 03, 04 සහ 05 ශ්‍රේණි |
| දෙවන කාණ්ඩය | - 06, 07, 08 සහ 09 ශ්‍රේණි |
| තෙවන කාණ්ඩය | - 10, 11, 12 සහ 13 ශ්‍රේණි |

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

චිත්‍ර තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ අඟල් 17 x 22 ප්‍රමාණයේ කඩදාසියක නිර්මාණය කළ යුතු වේ.

මෙම චිත්‍රය නිර්මාණය කිරීම සඳහා පැස්ටල්, දියසායම්, පැන්සල් වැනි ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකි ය. : **( මෙම කොන්දේසි සපුරා නොමැති චිත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

## පාසල් රචනා තරගය
### තරග කාණ්ඩ

| | | |
|---|---|---|
| පළමු කාණ්ඩය | - | 06 ශ්‍රේණිය සිට 09 ශ්‍රේණිය දක්වා (වචන 300 ක උපරිමයකට යටත්ව) |
| දෙවන කාණ්ඩය | - | 10 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය දක්වා (වචන 500 ක උපරිමයකට යටත්ව) |

**නිර්මාණ මාධ්‍ය**

1. සිංහල මාධ්‍ය
2. දෙමළ මාධ්‍ය

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

පළමු කාණ්ඩය  - අයදුම්කරුවන් වචන 300ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.

දෙවන කාණ්ඩය - අයදුම්කරුවන් වචන 500ක උපරිමයකට යටත් ව රචනා ඉදිරිපත් කළ යුතු ය.

**ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග**

සියලු තරගවල අවසාන ජයග්‍රාහකයින් හට පහත සඳහන් අයුරින් ත්‍යාග පිරිනැමේ.

**ප්‍රථම ස්ථානය**

**රුපියල් 15,000/-ක් , තිළිණයක් සහ සහතික පතක්**

**දෙවන ස්ථානය**

**රුපියල් 10,000/- ක් , තිළිණයක් සහ සහතික පතක්**

**තෙවන ස්ථානය**

**රුපියල් 7,500/- ක් , තිළිණයක් සහ සහතික පතක්**

**කුසලතා ත්‍යාග**

**රුපියල් 3,000/- ක් බැගින් වූ කුසලතා ත්‍යාග 10ක් සහ සහතික පත් 10 ක්**

**ත්‍යාග ප්‍රදානය**

ජයග්‍රාහකයන්ට හිමි ත්‍යාග 2024 ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් පැවැත්වෙන ජාතික උත්සවයේ දී ප්‍රධානය කෙරේ.

**අයදුම්පත් සමඟ නිර්මාණ ඉදිරිපත් කිරීම**

සියලු අයදුම්කරුවන් ඒ සඳහා නියමිත අයදුම්පත සමඟින් ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ ඔබගේම නිර්මාණයක් බවට ඔබ ඉගෙනුම ලබන විදුහලේ, විදුහල්පති විසින් සහතික කරවා ගෙන 2024 සැප්තැම්බර් මස 06 දිනට ප්‍රථම තැපැලෙන් හෝ පෞද්ගලිකව හෝ පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු වේ. අයදුම්පත්‍රය රහිතව ඉදිරිපත් කෙරෙන නිර්මාණ භාර ගනු නොලැබේ. ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ලෝක ජනාවාස දිනය 2024 - නිර්මාණ යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත සදහන් තරඟ සඳහා ඉදිරිපත් කරන සියලු නිර්මාණ සඳහා අයදුම්පත් පහත සඳහන් ලිපිනයෙන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වෙතින් හෝ www.nhda.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි වේ.

**ලිපිනය -** **සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක) ,**
**තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය ,**
**07 වන මහල ,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ,**
**චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත ,**
**කොළඹ - 02 .**

**දුරකථන අංක ඃ 011-2447038 / 011-2389513 / 0112-447207**

# <u>2024 ලෝක ජනාවාස දිනය.</u>

**පාසල් චිත්‍ර / රචනා තරගය සඳහා අයදුම්පත**

**සහභාගි වන තරගය කාණ්ඩය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම ඃ ------------------------------------------------------------------
2. ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය ඃ -------------------------------------------------------------
3. පාසල අයත් දිස්ත්‍රික්කය හා දුරකථන අංකය ඃ ---------------------------------------------------
4. පෞද්ගලික ලිපිනය හා දුරකථන අංකය ඃ ----------------------------------------------------
5. උපන් දිනය ඃ ---------------------------------------------------------------------------------
6. 2024 අගෝස්තු මස 01 දිනට වයස අවුරුදු ඃ ----------------------------------------------------

මෙම අයදුම්පත් සමඟින් ඉදිරිපත් කොට ඇති චිත්‍රය / රචනාව මා විසින් නිර්මාණය කරන ලද චිත්‍රයක්/ රචනාවක් බව මෙයින් සහතික කරන අතර, අදාළ චිත්‍ර / රචනා තරගාවලියේ සියලු තරග කොන්දේසිවලට යටත් ව ඉදිරිපත් කොට ඇති අතර, එකී තරගයේ විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට මා එකඟ බව මෙයින් දන්වනු කැමැත්තෙමි.

-------------------

අත්සන

දිනය ඃ ------------------------

------------------------------------------------------- විසින් මෙම අයදුම්පත සමඟින් ඉදිරිපත් කර ඇති චිත්‍රය / රචනාව නිර්මාණය කොට ඇති බවත්, ඉහත අයදුම්පතෙහි ඉදිරිපත් කොට ඇති සියලු තොරතුරු සත්‍ය බවත්, මෙයින් සහතික කරමි.

---------------------------

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය ඃ -------------------------

**සැලකිය යුතුයි - [ මෙම අයදුම්පත නිර්මාණවල පසුපිටේ අලවා ඇති නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිර්මාණය සමඟ අමුණා එවීමට කටයුතු කරන්න.]**